122836
07/10

අංගුත්තර නිකායෙහි කැටි ගැන්වෙන

බෞද්ධ

ගෘහස්ථ ආචාර ධර්ම

**B U D D H I S T   L A Y   E T H I C S**

**as crystallized**

**in**

THE ANGUTTARA NIKAYA.

ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය

සඳහා

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයට

ඉදිරිපත් කරන ලද

නිබන්ධය.

CR

**2521 බව.**

**අප්‍රේල් 1978.**

**එගොඩමුල්ලේ අමරමෝලි හිමි.**

**SPA 265.**

122836

122836

පූර්වාචාර්ය (පුබ්බාචරිය) හෙයින්

මා පිය දෙපළගේ

හා

පශ්චිමාචාර්ය පැවිදි- ගිහි

උතුමන්ගේ

නාමයන්ට

උපහාරයකි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ භාෂා හා
සංස්කෘතික අධ්‍යයනාංශ ප්‍රධානව සිටි, වර්තමාන
උපකුලපති, මහාචාර්ය ජේ.ජිනදාස පෙරේරා, වර්තමාන
අධ්‍යයනාංශ ප්‍රධාන ආචාර්ය චන්ද්‍ර විජුම් ගමගේ, මගේ උපදේශක
වරයා ලෙස මග පෙන්වූ කථිකාචාර්ය පී.ආරියපාල පෙරේරා
ඇතුළු ආචාර්ය මණ්ඩලය ද–

ප්‍රාරම්භයේ දීම උපදෙස් දීමෙන් මා මෙහෙය වූ
ආචාර්ය සෝමිය විරසේකර, ආචාර්ය
එල්.පී.එන්.පෙරේරා යන මහතුන් ද –

කළුපාන මිත්‍ර ලංවිත මාකල්ලේ විපුලතිස්ස හිමිපාණන් ද
කෘතඥතා පූර්වකව ගෞරවයෙන්
සිහිපත් කරමි.

# පටුන


හැඳින්වීම

සංක්ෂේප

1. පරිච්ඡේදය 1 - 39

ආචාර ධර්ම: බටහිර පසු තලය

භාරතීය පසු තලය

බෞද්ධ පසු තලය

බෞද්ධ ආචාර ධර්ම

ප්‍රායෝගික අංශය.

2. පරිච්ඡේදය 40 - 54

බෞද්ධ ගෘහස්ථ ජීවිතයේ පදනම.

3. පරිච්ඡේදය 55 - 79

බෞද්ධ ආචාර ධර්මයන් හි පදනම (සීලය)

4. පරිච්ඡේදය

බෞද්ධ ගෘහස්ථ ආචාර ධර්ම:

4-1. පුද්ගලගත ආචාර ධර්ම 80 - 111

උත්ථාන වීර්යය - ස්ථානෝචිත ප්‍රඥාව

සුවච භාවය - කල්‍යාණ මිත්‍ර සේවනය

අල්පේච්ඡතාවය - පතිරූපදේශ වාසය

මිතාහාරීත්වය - අකම්පනගුණය

ඉන්ද්‍රිය දමනය.

4-2. සමාජගත ආචාර ධර්ම. 112 - 135

සමගිය-කෘතඥතාවය-ප්‍රියවාදීත්වය හා

සත්‍යවාදීත්වය-මෛත්‍රිය හා කරුණාව

ක්ෂමාශීලීත්වය-පරාර්ථ චර්යාව-ධර්ම

චර්යාව.

4-3. සාමාජික ප්‍රගති. 136- 153

4-4. පුද්ගලයා හා ආර්ථිකය.

  බෞද්ධ ධන සංකල්පය 154-163

4-5. බෞද්ධ රාජ්‍ය සංකල්පය 164 - 173

5. පරිච්ඡේදය

  සදාචාරවත් භාවයේ අග්‍ර ඵලය. 174-179

ග්‍රන්ථ නාමාවලිය

විශ්වවිද්‍යාලය
පුස්තකාලය

# හැඳින්වීම

අංගුත්තර නිකාය පාලි ත්‍රිපිටකයේ සූත්‍ර පිටකයට අයත් නිකාය ග්‍රන්ථ පසෙන් සිව්වැන්නයි. ඒකක ද්‍රිකාදි වශයෙන් උත්තරෝත්තරයෙහි අධික වූ ධර්ම කොටස් ඇතුළත් කර සංග්‍රහ කරන ලද බැවින්, 'අංගුත්තර' නම් වේ. (ඒකකාදීහි අංගෙහි උපරූපරි උත්තරො අධිකොති අංගුත්තරො – සුම. පිට) පන්සියයක් රහතුන් විසින් සංගෘහිත වූ බැවින් 'සංගීති' යනුවෙන් ද, ආචාර්ය පරම්පරා උගත කරන බැවින් 'ආගම' නමින් ද හැඳින්වෙන මෙය සුමංගල විලාසිනී, පපංච සූදනී අනුවාවන් හි ඒකුත්තර (ඒකොත්තර) නිකාය නමින් ද හඳුන්වා ඇත. බෞද්ධ සංස්කෘතයෙහි අංකෝත්තර නමින් ද දක්වා තිබේ.

ඒකකාදි වශයෙන් නිපාත එකොළොසකින් ප්‍රතිමණ්ඩිත මෙහි සූත්‍ර සංඛ්‍යාව 9557 ක් වේ. (නව සුත්ත සහස්සානි පංච සුත්ත සතානි ච – සත්ත පඤ්ඤාස සුත්තානි හොන්ති අංගුත්තරාගමෙ. අභි.අ. 2 පිට) බණවර 120 කි. බණවරකට අක්ෂර 8000 ක් බැවින් අකුරු නව ලක්ෂ හැට දහසකි. බණවර සූත්‍ර හා අක්ෂර සංඛ්‍යාවෙන් සියළු නිකාය ග්‍රන්ථ අතර විශාලතමය අංගුත්තර නිකාය යි. බුද්ධ ඝෝෂ හිමි – "ධම්ම කථික පුංගවානං විචිත්ත හි පටිභාන ජනනන...." යනුවෙන් විශේෂ වර්ණනයට ලක් කරන්නේ ද එහි වැදගත්කම සැලකීමෙනි.

සර්වාගත ධර්මය අනගාරිකයන් සඳහා ම දේශිතයක් නොවේ. අගාරික ජීවිතයට අදාළව පැවැත් වූ දේශනා රාශියක් ද වේ. යථෝක්ත අති විශාල සංඛ්‍යාවක් වූ සූත්‍ර දේශනාවන් අතරෙහි ගෘහස්ථ ආචාර ධර්ම විසිරී, ව්‍යවහිතව පවතී. ඒ සියල්ල එක් රැස් කළ කල්හි වජ්‍ර පාෂාණයක් මෙන් මහාර්ඝ වේ. ප්‍රස්තුතයෙහි 'කැටිගැන්වෙන' යනුවෙන් යොදාගත් වචනය එම අර්ථයෙන් යොදා ගත්තෙමි. එහෙත් 'CRYSTALLIZE' යන්නට අනුරූප අදහසක් එයින් ඉදුරා ප්‍රකාශ නොවේ.

කෙසේ වෙතත් මෙහි දී අංගුත්තර නිකායාන්තර්ගත ගෘහස්ථ ආචාර ධර්ම ඒකරාශී කොට සංග්‍රහ කර දැක්වීමට යථා ශක්තියෙන් යත්න දැරීමි.

**සංකේත.**

1. අං.නි. අංගුත්තර නිකාය.
2. අනිඅ. අංගුත්තර නිකාය අට්ඨකථාව.
3. අනිටී. අංගුත්තර නිකාය ටීකා.
4. උදාපා. උදාන පාලි.
5. සාම. සාමවේද.
6. ඓ.බ්‍රා. ඓතරෙය බ්‍රාහ්මණ.
7. කඨ කඨොපනිෂද්.
8. ඡා.උ. ඡාන්දොග්‍ය උපනිෂද්.
9. ජා. ජාතක පාළි.
10. ජා.අ. ජාතකට්ඨකථා.
11. තෛ.උ. තෛත්තිරිය.
12. ථෙර ථෙරගාථා පාළි.
13. දී.නි. දීඝ නිකාය.
14. ධ.ප. ධම්මපද.
15. ධ.ප.අ. ධම්මපදට්ඨ කථා.
16. නිද්දෙස නිද්දෙස පාළි.
17. පා.පා. පාරාජිකාපාළි.
18. ප්‍ර.උ. ප්‍රශ්නෝපනිෂද්.
19. බෘ.උ. බෘහදාරණ්‍යක උපනිෂද්.
20. බෝ.ච. බෝධිචර්‍යාවතාරය.
21. භ.ගී. භගවද්ගීතා.
22. භා.ද.ඉ. භාරතීය දර්ශන ඉතිහාසය.
23. ම.නි. මජ්ඣිම නිකාය.
24. ම.ව. මහාවග්ග පාළි.
25. සං.ඉ.ද. සංක්ෂිප්ත ඉන්දිය දර්ශන.

| | |
|---|---|
| 26. සිං.ජා | සිංහල ජාතක පොත. |
| 27. සං.නි. | සංයුත්ත නිකාය. |
| 28. සිං.වි.කෝ. | සිංහළ විශ්ව කෝෂය. |
| 29. සු.නි. | සුත්තනිපාත. |
| 30. සු.නි.අ. | සුත්තනිපාත අට්ඨකථා. |
| 31. සු.ම. | සුමංගල විලාසිනී. |
| 32. ශ්වේ. | ශ්වේතාශ්වතර උපනිෂද්. |
| 33. ශතපථ. | ශතපථ බ්‍රාහ්මණ. |
| 34. වි.ම. | විසුද්ධි මග්ගො. |

## ABBREVIATIONS.

| | | |
|---|---|---|
| BANTR | - | Buddhism A Non Theistic Religion |
| BE. | - | Buddhist Ethics. |
| Con. | - | This Confused Society. |
| DPPN | - | Dictionary of Pali Proper Names. |
| EB | - | Ethics of Buddhism. |
| EBTK | - | Early Buddhist Theory of Knowledge. |
| En.B | - | Encyclopaedia of Buddhism. |
| ERE | - | Encyclopaedia of Religion and Ethics. |
| IP | - | Indian Philosophy. |
| Small | - | Small is Beautiful. |
| UCR | - | University of Ceylon Review. |

## 1 වන පරිච්ඡේදය

## අංගුත්තර නිකායෙහි හැඩිගැස්වෙන බෞද්ධ ගෘහස්ථ ආචාර ධර්ම

බටහිර පසුතලය:

'ආචාර ධර්ම' පෙරපර දෙදිගම දාර්ශනිකයන්ගේ අවධානයට ලක්වූ විෂයයකි. ආචාර ධර්ම, ETHICS (ඉංග්‍රීසි) යන්නෙහි මූලය ETHOS (ග්‍රීක්) ETHICOS (ග්‍රීක්) යන වචනයෙහි වේ. ETHICOS යන ග්‍රීක් වචනයෙහි අර්ථය 'චරිතය'යනු ය. ETHOS යන්නෙන් ETHICS යන ඉංග්‍රීසි වචනය ගත්තා සේම සමානාර්ථයක් දෙන MORAL යන ඉංග්‍රීසි වචනය ද MORES (ලතින්) යන්නෙන් ගෙන ඇත. එම වචන දෙකේම අර්ථය 'පුරුදු හෙවත් සිරිත් විරිත්"(HABITS AND CUSTOMS ) යනුය. පුද්ගලයෙකුගේ හෝ සමාජයක ආචාර ධර්ම හෙවත් සදාචාරය ඔවුන් පුරුද්දෙන් හෝ චාරිත්‍රානුකූලව කරන කාර්යයන් හා සම්බන්ධ නොවන අතර, යමක් කිරීම උචිතය, නිවැරදිය යන හැඟීමෙන් කෙරෙණ හැසිරීම් මත එය රඳා පවතී. [1]

මේ විග්‍රහය අනුව ආචාර ධර්ම, පුද්ගලයාගේ සාමාන්‍ය චරිතයට පමණක් නොව විචාරශීලිත්වය හා විධංසනය පදනම් වූ චරිතාංගයන් කෙරෙහි ද විශේෂ යෙන් සම්බන්ධ වී ඇති අයුරු පෙනෙයි. මාර්ෂල් අර්බන් සඳහන් කරන පරිදි ආචාර ධර්ම, නිවැරදිව ක්‍රියා කරන්නේ කෙසේද?, කවර ක්‍රියා හරි හෝ වැරදිද, හොඳ හා නරක, හරි හා වැරදි සළකා බලනතාක් එය පුළුල් වේ. [2]

මිනිස් චරිතයේ හොඳ හා නරක විනිශ්චය කිරීම ආචාර ධර්මයෙන් කරනු ලබයි යන්න ප්‍රතික්ෂේප කරන ජී.ඊ.මුවර්, ආචාර ධර්ම, මිනිස් චරිතයේ යහපත හා අයහපත නොව, ප්‍රධාන වශයෙන් යහපත යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද යන්න පිළිබඳව

---

1. THE NEW ENCYCLOPAEDIA BRITANNICA Vol 6 p 977.

2. FUNDAMENTALS OF ETHICS_Marshel Urbon Cha.1 p 4.

පමණක් කරන විමර්ශනය හා සම්බන්ධ විෂයයක් යැයි අර්ථ කථනය කළහ.[3]

මහාචාර්ය බ්‍රෝඩ් පෙන්වා දෙන පරිදි හොඳ හා නරක පිළිබඳව කෙරෙන විමර්ශනය සම්බන්ධයෙන් මෙහි දී විශේෂ අවධානයක් යොමු කිරීම අනවශ්‍ය වේ.[4] අප කළ යුත්තේ කුමක් ද? යුතුකමයි. අප ලැබිය යුතුව ඇත්තේ මොනවා ද? අයිතිවාසිකමයි. අපගේ හැසිරීම විය යුත්තේ කුමක් ද? සදාචාරය යි. DUTY RIGHT AND VIRTUE ආචාර ධර්ම පිළිබඳව කෙරෙන කවර නිබන්ධනයක් වුව ද, මේ ප්‍රශ්න තුනට පිළිතුරු වශයෙන් කරන්නක් විය යුතු ය".[5] යනුවෙන් මාර්ෂල් අර්බන් කරන විවරණය වෙත නැවත අපගේ අවධානය යොමු කළ යුතු ය.

ඔහු මෙහි දී එම ක්ෂේත්‍රය තවත් පුළුල් අන්දමින් ඉදිරිපත් කරයි. ආචාර ධර්මයන්ට විද්‍යාත්මක ස්වරූපයක් ආරෝපනය වීමට මේ හොඳ නරක පිළිබඳ විමර්ශනය නිසා විශේෂ සම්ප්‍රාප්තියක් ඇති බව ඔහුගේ මතය යි.[6]

ආචාර ධර්ම ~~පිළිබඳ~~ අධ්‍යයනය පිළිබඳව ජෝන් එච්. මැකැන්සි කරන විග්‍රහය තුළින් එය තවත් පුළුල් ක්ෂේත්‍රයකට පැමිණේ. ඔහු සඳහන් කරන පරිදි ආචාර ධර්මය වනාහි හැසිරීමේ අඩංගු පරමාදර්ශය හෝ යුක්තිය හා අයුක්තිය හෝ යහපත හා අයහපත හෝ පිළිබඳව කරන සිද්ධාන්තමය අධ්‍යයනය යි.[7] මෙහි දී ආචාර ධර්මය, හැසිරීමේ පරමාදර්ශයට සම්බන්ධ කොට ඇති සෙයින් ඔහුගේ විග්‍රහය ද වචනයන් පිළිබඳ නානත්වයක් ඇති නමුත් බොහෝ දුරට අර්ථයෙන් ඉහත සඳහන් විග්‍රහයන් හා ඒකත්වයක් දරන බවක් පෙනේ.

---

3. Principia Ethica, G.E.Moore Cambridge University Press 1956. cha 1 p 2.
4. ආචාර ධර්ම වාදයේ සංවර්ධන ප්‍රභේද-අනුවා, රත්නයේ මුද්‍ර. ප්‍රථම 1966 පි.7-197 සි.
5. Fundamentals of Ethics. Urbon; Wilbur Marshel. George Allen and Unwin Ltd, London 1955. cha IX p 184.
6. Ibid p 13.
7. ආචාර ධර්ම අපි පොත-ජෝන් එච්. මැකැන්සි අනුවා. අනුදෙ. රත්නයේ මුද්‍ර 1969.

එච්.එච්.විලියම්ස් සඳහන් කරන්නේ ආචාර ධර්ම යන්න මානුෂික චර්යාවන් පදනම් කරගෙන ගොඩනැගී ඇති සියළුම ක්‍රියාවන් හැඳින්වීම සඳහා භාවිත වන වචනයක් බවයි. සමාජයෙන් සමාජයට යුගයෙන් යුගයට එය වෙනස් වන බව පවසන ඔහු, මානව වර්ගයාගේ ඓතිහාසික පරිණාමය විමර්ශනය කිරීම අතින් ද ආචාර ධර්ම විශේෂ වැදගත්කමක් උසුලන බව සඳහන් කරමින් ආචාර ධර්ම යන වචනය වඩා පුළුල් ක්ෂේත්‍රයකට යොමුකරයි. [8]

බ්‍රිතාන්‍ය විශ්ව කෝෂයේ ඉදිරිපත් කරන විමර්ශනය නූතන බටහිර ආචාර ධර්මයන්ගේ නවීනතාවන් කවර ආකාරයක් ගෙන ඇද්ද යන්න පැහැදිලි කරයි. එහි දී ආචාර ධර්මය සදාචාර දර්ශනය හා සමානාර්ථවත් සදාචාරාත්මක හොඳ නරක, හරි වැරදි යන කරුණු හා සම්බන්ධ වන දර්ශනයේ ශාඛාවක් වශයෙන් හඳුන්වමින්, සාම්ප්‍රදායිකව සදාචාර ප්‍රශ්නයන් හා සම්බන්ධ ප්‍රමාණබද්ධ ( NORMATIVE ) මිම්මක් වශයෙන් විග්‍රහ කිරීමට, ඇගැයීමට හා සංවර්ධනය කිරීමට යොදා ගෙන ඇත. එහි කාර්යය භාෂාව විග්‍රහ කිරීමය යනුවෙන් දක්වා තිබේ. [9]

ආචාර ධර්ම සම්බන්ධ වන ක්ෂේත්‍රය පිළිබඳව මහාචාර්ය මුයර් හෙඩ් කරන විග්‍රහය ද එහි ස්වභාවය පැහැදිලි කිරීමේ දී වැදගත් වෙයි. ඔහු සඳහන් කරන පරිදි " ... අපට දෙවර්ගයක විද්‍යාවන් ඇත. .... එනම් යම් යම් දෙයෙහි යථා ස්වභාවය පරිදි ඒ සම්බන්ධ විස්තරයන්ගෙන් යුතු ඒවා සහ යම් යම් දේ පිළිබඳව ඒ සම්බන්ධ අපගේ විනිශ්චයන්ගෙන් යුතු ඒවා යනුවෙනි. ප්‍රථම කොටස ස්වාභාවික විද්‍යා යනුවෙන් හඳුන්වන අතර, දෙවැනි කොටස ප්‍රමාණබද්ධ හෙවත් වඩා නිවැරදිව කියතොත් විවේචනාත්මක විද්‍යා යනුවෙන් දැක්වේ. ප්‍රකාශිත අර්ථයෙන් ආචාර ධර්ම විවේචනාත්මක වේ. එහි විෂයක්ෂේත්‍රය නම් මිනිස් චරිතය හා හැසිරීම ය. අනෙක් කරුණු පිළිබඳව ඓතිහාසික හේතුන්හි සම්බන්ධය ස්වාභාවික සිද්ධීන් වශයෙන් නොගැණේ. එහෙත් අදහස්වල හෝ මට්ටමේ හැටියට වටිනාකම් අයත් ප්‍රමාණයෙන් ගැණේ." [10]

---

8. ENCYCLOPAEDIA BRITANNICA 1926 vol9 p 809 article:ETHICS by Rev. H.H.WILLIAMS.

9. " " "

10. ENCYCLOPAEDIA OF RELIGION AND ETHICS, ed. JAMES HASTINGS, Edinburgh. T.andT.Clark; New York, Charls Scribner's Sons, 1908-26. Vol.5 p 414

මෙසේ ආචාර ධර්ම යන්න පිළිබඳව බටහිර විවේචකයන් හා විමර්ශකයන් දක්වා ඇති නොයෙකුත් අර්ථ විවරණයන් සමස්තයක් වශයෙන් සැලකිල්ලට ගැනීමේ දී එළඹිය හැකි සාධාරණ නිගමනය නම් ආචාර ධර්මයෙන් කරනු ලබන්නේ විවිධ ක්ෂේත්‍රයන්හි වූ නොයෙකුත් දෘෂ්ටි කෝණයන්ගෙන් හා ක්‍රමයන්ගෙන් මිනිස් ක්‍රියාවන් හදාරන්නට ප්‍රයත්න දැරීම බවයි.

මේ ආකාරයෙන් මිනිස් ක්‍රියාවන් හැදෑරීමට යාම හා සම්බන්ධ වීමත් සමඟම බටහිර ආචාර ධර්මඥයන් අතර එවන් ප්‍රශ්නයක් පැන නැගුණි. එනම් ආචාර ධර්ම අධ්‍යයනය කළයුත්තේ දාර්ශනික විමර්ශනයක් වශයෙන් ද නැතහොත් විද්‍යාත්මක විමර්ශනයක් වශයෙන් ද යනුයි. මේ අංශ ද්වය සමඟම ආචාර ධර්මයේ ඇති විවිධ සම්බන්ධතාවන් බටහිර ආචාර ධර්ම විවේචකයන් විසින් සලකා බලා ඇත. [11]

"බාහිර උත්තේජනවල හෙවත් පෙළඹීම්වල ප්‍රතිචාරය වශයෙන් සලකා බාහිර ලෙසින් පමණක් විස්තර කරන කල්හි ඒවා චර්යාවාදයට ද, මනුෂ්‍යයාගේ ශාරීරික නිර්මාණය අනුව චර්යාවන් හැඩගැසී ඇතැයි සලකන කල්හි ඒවා ජීව විද්‍යාවට ද, ක්‍රියාවන්ට කාරණ වූ චිත්ත ප්‍රවෘත්ති අනුසාරයෙන් සලකන කල්හි ඒවා මනෝ විද්‍යාවට ද, ඔහුගේ සමාජයේ ජාති ගෝත්‍ර හැඩගැසීම අනුව සලකන කල්හි ඒවා සමාජ විද්‍යාවට හා මානව විද්‍යාවට ද විෂය වෙයි." [12]

අවශේෂ විද්‍යාත්මක විෂයයන්ගෙන් ආචාර ධර්ම විශේෂිත වන මූලික ලක්ෂණය නම් විස්තරාර්ථ දැක්වීම හා විශ්ලේෂණයට පමණක් සීමා නොවී ක්‍රියා ඇගැයීමේ යෙදීමය. ක්‍රියා ඇගැයීමේ මිනුම් දණ්ඩක් කොට ගතයුතු පරමාදර්ශ ගවේශණය ද ආචාර ධර්මයේ මූලික කර්තව්‍යයක් බවට පත්ව ඇති බව ආචාර ධර්මඥයන්ගේ අදහසයි.

---

11. Encyclopaedia Britannica. Vol 6 p 976.

12. සිංහල විශ්ව කෝෂය. කාණ්ඩය 2. පි.422 වර්ෂ 1965.

මේ අනුව පළමුවෙන්ම දේශකාල විනිර්මුක්ත ග්‍රාහ්‍යරූපී සාර්වකාලීන පරමාදර්ශයන් සෙවීම ආචාර ධර්මයේ මූලික කාර්යය වෙයි" යනුවෙන් ඇතැම් ආචාර ධර්මඥයන් ප්‍රකාශ කරතත්, මහාචාර්ය වොල්ෆ් ඒ පිළිබඳව දක්වන අදහස මෙහි දී අවධානයට ගතයුතුය. "ආචාර ධර්මය අස්ත්‍යර්ථක ( POSITIVE ) විද්‍යාවක් නොවේ. ප්‍රමාණබද්ධ ( NORMATIVE ) විද්‍යාවකි. එය ප්‍රාථමික වශයෙන් මිනිසාගේ තථ්‍ය හැසිරීම හා සම්බන්ධ නොවේ. පරමාදර්ශ ( IDEAL ) හැසිරීම හා සම්බන්ධ වේ. සත්‍ය ලෙසම බොහෝ සදාචාර දාර්ශනිකයෝ ආචාර ධර්මයේ කාර්යයට ඇතුළත් වන්නේ පවත්නා සදාචාර සංකල්පයන් පැහැදිලි කිරීම හා ඒවායේ ගැබ්ව පවත්නා ආවශ්‍යක පූර්ව සංකල්පනාවන් හෙළිදරව් කිරීමත් යැයි දක්වති. නව සදාචාර සංකල්ප ගවේෂණය එහි කාර්යය නොවන බව ද කියති. මෙවැනි කිසියම් වගකීමකින් හා ක්‍රිස්තියානි පල්ලියෙන් බැඳී නොසිටියේ නමුදු ඇරිස්ටෝටල්ගේ ආචාර ධර්ම පවා මීට වඩා යමක් විග්‍රහ කර ඇත යන කරුණ සඳහන් කළයුතු ය." [13]

ආචාර ධර්මයෙන් කරනු ලබන්නේ පරමාදර්ශවත් හැසිරීම මිස තථ්‍ය හැසිරීම විමර්ශනයට ලක් කිරීම නොවන බව පළමුව සඳහන් කරන වොල්ෆ් දෙවනුව, ජෙරමි බෙන්තම් ආදීන් ඉදිරිපත් කරන අදහස් දක්වයි. නූතන ආචාර ධර්මයන් සම්බන්ධ මූලික ප්‍රශ්නයන් ඔහු මෙසේ ඉදිරිපත් කරයි.

1. යහපත් හැසිරීමේ ආවශ්‍යක තත්වය වශයෙන් ප්‍රයෝජනයට ගත හැකි මිනිස් හැසිරීමේ පරම යහපත හෙවත් එහි පරමාදර්ශී අරමුණ.

11. යහපත හා අයහපත පිළිබඳව හෙවත් පරම යහපත පිළිබඳව දැනීමේ ආරම්භය හෙවත් මූලය.

111. සදාචාර හැසිරීමේ අනුදැන්ම.

1v. යහපත් චරිතය, පෙළඹවීම් ආදියයි.

---

13Ecyclopaedia Britannica,ed.1951 Vol. 8 p 737.article on Ethics by Abraham Wolf.

14. ග්‍රීක දර්ශනය, ඒ.ඩී.පී.කලන්සූරිය, අ.ශ.ප.දෙ. ලංකාණ්ඩුවේ මුද්‍ර.1971. පරි.x පි.124.

සදාචාර දාර්ශනිකයන්ගේත් තවත් ප්‍රශ්නයකි, ඉච්ඡා ස්වතන්ත්‍රතාවය ( FREEDOM OF WILL )

මේ සියල්ල කරුණු පරීක්ෂා කොට නිගමනයකට එළඹීමේ දී ප්‍රධානතම කරුණ 'පරම යහපත යනු කුමක්ද?' යන්නයි. පරම යහපත කුමක් දැයි කෙරෙන විනිශ්චය මත හොඳ නරක විනිශ්චය කළයුතු ය. පරම යහපත සාක්ෂාත් කළයුතු මඟ විනිශ්චය කළහැක්කේ එවිට ය.

මිනිසා බලාපොරොත්තු වන පරම යහපත කුමක් ද යන්න පිළිබඳව කළ විවිධ විවේචනයන්ගේ හා විමර්ශනයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන් බිහි වූ ආචාර ධර්මාත්මක ඉගැන්වීම් සමූහයකින් බටහිර ආචාර ධර්ම ඉතිහාසය පිරී පවතී.

පරම යහපත ලෙසින් සොක්‍රටීස් ඉදිරිපත් කළේ සාධුත්වයයි. ඔහු ඉදිරිපත් කළ පරිදි සාධුත්වය ඥානය ( KNOWLEDGE ) හා බැඳී පවතී. ජන සම්මත සාධුත්වය හා දාර්ශනික සාධුත්වය යනුවෙන් ඔහු දෙවැදෑරුම් සාධුත්වයක් ඉදිරිපත් කරයි. දෛනික ජීවිතයේ දී හමුවන සාධුත්වයට ජනසම්මත සාධුත්වය ( POPULAR GOODNESS ) යැයි පවසන සොක්‍රටීස් සත්‍ය සාධුත්වය, දාර්ශනික සාධුත්වය (PHILOSOPHICAL GOODNESS) ලෙසින් හඳුන්වයි. ඥානය වන්නේ අපරෝක්ෂයයි.[15] ඥානය අතිප්‍රධාන නොවී සද්ගුණයන් ගොඩනැගිය නොහැකි ය. මේ අනුව ඥානය හෙවත් සාධුත්වය ලබාගැනීම සදාචාරය හා සම්බන්ධව පවතී.

ප්ලේටෝ ද මිනිස් ජීවිතයේ පරමාදර්ශය වශයෙන් ඉදිරිපත් කරන්නේ සාධුත්වයයි. එහෙත් සොක්‍රටීස් ඉදිරිපත් කරන සාධුත්වය අධ්‍යාත්මයට නැඹුරු ය. ඔහු REPUBLIC නම් ග්‍රන්ථයේ සඳහන් කරන පරිදි "සෑම ව්‍යායාමයකම අවසානය නම් යහපතයි. සෑම හදවතක බලාපොරොත්තුව එයයි. යහපත දිව්‍යමය වෙයි. එහෙත් ඒ ගැන යමක් පැවසීම ඉතාමත් දුෂ්කර කරුණකි.[16] එහිම තවදුරටත් දැක්වෙන අයුරු මෙම සාධුත්වය හෙවත් යහපත දේශපාලනයට සම්බන්ධ වන අතර එය ලබාගත හැක්කේ

---

15. ග්‍රීක දර්ශනය. ඒ.ඩී.පී.කලන්සූරිය. අ.ශ.ප.දෙ. ලංකාණ්ඩුවේ මුද්‍ර. 1971 පරි.x පි.124

16. එම

ඔහු සඳහන් කරන සමාජ සෝපානයේ පළමුවැන්න වූ දාර්ශනික පාලක පන්තිය විසිනි. ඔවුන්ට ද එය ලබාගත හැක්කේ විශේෂ ක්‍රමයක අධ්‍යාපනයක මාර්ගයෙනි. [17] ඒ දාර්ශනික පන්තිය යුක්තිය ඉටු කරන්නේ නම් සද්ගුණය වැඩේ. එය ප්‍රඥාවයි.

REPUBLIC නම් ග්‍රන්ථයේ ඔහු සඳහන් කරන අයුරු "අතිශ්‍රේෂ්ඨ යහපත නම් වූ ආකෘතිය ප්‍රත්‍යක්ෂය ලැබීමෙන් පසු සියලුම යහපත් සහ නිවැරදි ක්‍රියාවන්ට වගකියනු ලැබේ. ආලෝකයේ උල්පත ද එය වනු ඇත." එහෙත් ඔහු ඉදිරිපත් කරන මේ සාධුත්වය ලැබිය යුත්තේ ලෝකෝත්තර තත්වයක දී ය. එහෙයින් එය සාමාන්‍ය මිනිසා විසින් ලබාගත හැක්කක් නොවෙයි. සාධුත්වය පිළිබඳ ඥානය විශේෂ ආගමික ප්‍රකාශනයකින් ලබා දෙනු ලබන්නක් හෙවත් වගකිවයුතු ගුරුවරුන් අත ඇති දීර්ඝ ප්‍රඥාමය විනයකින් ලබාගත යුත්තකි. [18]

බටහිර ආචාර ධර්මයේ පියා ලෙස ගැනෙන ඇරිස්ටෝටල්, මිනිසාගේ පරමාදර්ශය වශයෙන් ඉදිරිපත් කොට ඇත්තේ කුමක් ද යනු සලකා බැලිය යුතුය.

ඔහු විසින් රචිත METAPHYSICS හා De Anima යන ග්‍රන්ථ ද්වයෙන් මෙන්ම, ආචාර ධර්ම පදනම් කොට රචනා කරන ලද NicomacheanEthics සහ MAGNA MORALIA යන ග්‍රන්ථ මගින් ද ඉදිරිපත් කරන පරමාදර්ශය නම් සාධුත්වය යි. [19] එහෙත් ඇරිස්ටෝටල් හෝ ප්ලේටෝ හෝ සුඛයත් සොම්නසත් එකක් කොට නොගත්තේය. සුඛය යන්නෙන් ඔවුන් දක්වන්නේ මිනිසාගේ විශිෂ්ඨ වූ ලක්ෂණය වන විචාර බුද්ධියට අනුකූල වූ පැවැත්මයි. [20] ඔහු යහපත යනුවෙන් අදහස් කරන්නේ සර්ව සම්පූර්ණ යහපත ( ABSOLUTE GOOD ) හෝ දෙවියන්ගේ යහපත හෝ නොව රාජ්‍යයේ වෙසෙන පුද්ගලයාගේ යහපතයි. මෙම උත්තම මනුෂ්‍ය යහපත වශයෙන් ඔහු හඳුන්වන්නේ ඔවුන්ගේ සැපත ( HAPPINESS ) යි. NICOMACHEAN ETHICS හිදී 'සෑම කලාවක් ( CRAFT ) සහ පරීක්ෂණයක් මෙන්ම සෑම ක්‍රියාවක් හා ව්‍යාපාරයක්ම

---

17. ග්‍රීක දර්ශනය. ඒ.ඩී.පී.කලන්සූරිය. අ.ග්‍රු.ප්‍ර.දෙ. ලංකාණ්ඩුවේ මුද්‍රණ: 1971. පරි: x. පි.124
18. A Short History of Ethics-Reginald A P Rogers-Macmillan and Co Ltd London 1952 p 55.
19. Ibid p 77
20. Encyclopaedia Britannica 1926 ed Vol 2 p 512.
21. සිංහල විශ්ව කෝෂය II කාණ්ඩය 423 පිට.